## පාසල් යාම අනිවාර්යය වීම.

**නො 296 පනතට අනුව 27 දෙසැම්බර් 2006 සිට සියලුම අවුරුදු 6 සිට අවුරුදු 16 දක්වා දරු දැරියන් පාසල් යාම අනිවාර්යය වේ.**

දරු දැරියන් පාසල් යාම සිදු නොකළහොත් එහි වගකීම දෙමාපියන් සතුවේ.

ප්‍රාථමික අංශය හා ද්වීතියික පාසල් වල අධ්‍යක්ෂක හා මහ නගර සභාවේ නගරාධිපතිගේ අධීක්ෂණයට ලක්වේ.

අධීක්ෂණය කිරීමේදී දරුවන් වෙනත් පාසලකට සහභාගී වේ නම් පාසල් සඳහා පැමිණීමේ සහතිකය ඉදිරිපත් කළ යුතුය.

---

## ලියාපදිංචිය

ලියාපදිංචිය ජනවාරි මාසයේ සිදුකළ යුතුය. යම් කිසි ගැටළුවක් පැන නැගුණු විට පාසල් කාර්යාලයෙන් උපකාර ඉල්ලා සිටිය හැක.

පාසල් වසර තුළදී ලියාපදිංචි කළ ලිපි ලේඛන පාසල් කාර්යාලයට ඉදිරිපත් කළ යුතුය.

විදේශීය පාසල් වලට සහභාගී වූ සිසුන් සඳහා එම පාසල් වලටි අදාළ ලිපි ඉදිරිපත් කළ යුතුය.

පාසලේ ලේකම් කාර්යාලය හරහා ලියාපදිංචිය සිදුකරන විට දෙමව්පියන්ගේ හා දරුවන්ගේ **Codice Fiscale** හි ඡායා පිටපතක් රැගෙන යා යුතුය.හැඳුනුම්පත, විදේශ ගමන් බලපත්‍රය හා පදිංචි බලපත්‍රයේ (අනිවාර්යය නොවේ) ඡායා පිටපත් රැගෙන යා යුතුය.

---

## වෙනත් පාසලකට මාරු කිරීම.

**ඉතාලියේ වෙනත් පාසලකට මාරු කිරීම:**

- දරුවා ලියාපදිංචි කරන ලද පාසලේ නාම සහ ලිපිනය දෙමව්පියන් විසින් දැනුවත් කළ යුතුය.
- මාරු කිරීම සඳහා අනිවාර්යය අනුමැතියක් පාසල විසින් නිකුත් කරනු ලබයි.
- ඊළඟ වසර තුළ ස්ථාන මාරුවීම සඳහා, පාසල අවසානයේ ජුනි 30 වන දිනට පෙර අනිවාර්යය අනුමැතිය පාසල විසින් නිකුත් කරනු ලැබේ.

**විදේශීය පාසලකට මාරු කිරීම:**

- දරුවන් ලියාපදිංචි කර ඇති පාසලේ කාර්යාලයෙන් විදේශීය රටකට මාරුවීමේදී පිරවිය යුතු ආකෘතිය සම්පූර්ණ කළ යුතු අතර, දරුවන් ඇතුළත් කරන නව පාසල සඳහන් කළ යුතුය.(අනිවාර්යය නොවේ.)
- පාසල විසින් දරුවාට ''පාසල් ශිෂ්‍ය වාර්තාවක්'' නිකුත් කරයි.